# **ව්‍යවස්ථාව ආරක්ෂා කරන ලෙස ශ්‍රී ලංකාවේ නායකයින්ගෙන් ගෞරවනීය වැඩිහිටියන් ඉල්ලා සිටී**.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ තනතුරෙන් ඉවත් කිරීමට හා පාර්ලිමේන්තු වාරය අවසන් කිරීමට ගත් ව්‍යවස්ථා විරෝධී තීන්දුවත් සමඟින් ශ්‍රී ලංකාවේ ඇතිවී තිබෙන තත්ත්වය පිළිබඳව ගෞරවනීය වැඩිහිටියන් දැඩි සැලකිල්ලක් දක්වති.

*" ජනාධිපති සිරිසේන විසින් සාමය, යුක්තිය සහ සංහිඳියාව ඇති කිරීම සඳහා සිය ජනතාවට අතීතයේදී ලබාදුන් පොරොන්දු ඉටු කිරීම වෙනුවෙන් පෙනී සිටිය යුතුය. ඒ සියල්ල ළඟාකරගත හැක්කේ ව්‍යවස්ථාව දැඩි ලෙස පිළිපැදීමෙන් හා ගරු කිරීමෙන් පමණි." - හිනා ජිලානි*

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ තනතුරෙන් ඉවත් කිරීමට හා පාර්ලිමේන්තු වාර අවසන් කිරීමට ගත් ව්‍යවස්ථා විරෝධී තීන්දුවත් සමඟින් ශ්‍රී ලංකාවේ ඇතිවී ඇති පෙර නොවූ විරූ තත්ත්වයක් සම්බන්ධයෙන් ගෞරවනීය වැඩිහිටියෝ අද දින ඔවුන්ගේ දැඩි කනස්සල්ල පල කළහ.

රටේ දේශපාලනික හා ව්‍යවස්ථාමය අර්බුදය විසඳීම සඳහා පළමු පියවර ලෙස පාර්ලිමේන්තුව වහාම යලි කැඳවන ලෙසට ඔවුහු ජනාධිපති සිරිසේනගෙන් ඉල්ලා සිටියහ.

නීතියේ ආධිපත්‍යයට දැඩිව අනුකූල වෙමින්, මානව හිමිකම් සහ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තිවලට ගරු කරමින්, දේශපාලන ආතතීන් උග්‍ර කිරීමට හා ප්‍රචණ්ඩත්වයට හේතු විය හැකි ඕනෑම ක්‍රියාමාර්ගයකින් වැළකී සිටින ලෙස, ගෞරවනීය වැඩිහිටියෝ සියලුම දේශපාලනික නායකයින්ගෙන් ඉල්ලා සිටියහ.

**ග්‍රෝ හාර්ලම් බරන්ඩ්ට්ලන්ඩ්,** ගෞරවනීය වැඩිහිටි සහ නෝර්වේහි හිටපු අගමැති මෙසේ පැවසීය:
*"ශ්‍රී ලංකාව පෙර නොවූ විරූ ව්‍යවස්ථාමය අර්බුදයකට මුහුණ දෙමින් සිටින අතර එය සාමකාමී සහ නෛතික ක්‍රමයකින් වහාම විසඳාගත යුතුය. වසර ගණනාවක් තිස්සේ පැවැති ගැටුම් හා මානව හිමිකම් උල්ලංඝනයන්ගෙන් ශ්‍රී ලංකාව අනේක පීඩා විඳ ඇති අතර, වගකීමෙන් තොර දේශපාලන පියවරයන් දැරිය නොහැකිය. ප්‍රජාතන්ත්‍රවාදය හා ව්‍යවස්ථාමය සම්මතයන්ට ගරු කිරීමෙන් සියලූ ශ්‍රී ලාංකිකයන්ගේ යහපත උදෙසා කටයුතු කරන මෙන් ජනාධිපති සිරිසේනගෙන් ඉල්ලා සිටිමි."*

තවදුරටත් ව්‍යවස්ථානුකූල නොවන ක්‍රියාවන් තුළින් දශක ගණනාවක සිවිල් යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම ගෙන ඇති, දුර්වල තත්ත්වයක පවතින සංහිඳියා හා යළි ගොඩනැංවීමේ ක්‍රියාවලීන් අනතුරට ලක්වීමේ අවදානමක් ඇති බවට ගෞරවනීය වැඩිහිටියන් අනතුරු ඇඟවීය. රාජ්‍ය නායකයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංගනය කළහොත් රජයේ ආයතන කෙරෙහි ඇති විශ්වාසයට බරපතල ලෙස හානි සිදු විය හැකිය.

ඇල්ජීරියාවේ හිටපු විදේශ ඇමති සහ එක්සත් ජාතීන්ගේ රාජ්‍ය තාන්ත්‍රිකයෙකු වන ගෞරවනීය වැඩිහිටි **ලක්ඩාර් බ්‍රාහිමී**, මෙසේ පැවසීය:

*"වසර ගණනාවක ගැටුම් සහ වේදනාකාරී තත්ත්වයන් හමුවේ ශ්‍රී ලංකාව මෙවැනි බරපතල ව්‍යවස්ථාමය අර්බුදයකට කවදාහෝ මුහුණදී නැත. රටේ නායකයින් ව්‍යවස්ථාපිත නීතිය හා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සම්ප්‍රදායන් අනුව කටයුතු කළ යුතු අතර, විනිවිදභාවයෙන්, වගවීමෙන් සහ මානව හිමිකම්වලට සම්පූර්ණයෙන් ගරු කරමින් පාලනය කළ යුතුය."*

**<u>හිනා ජිලානි</u>**, ගෞරවනීය වැඩිහිටි හා පකිස්ථාන මානව හිමිකම් ක්‍රියාකාරිනිය මෙසේ පැවසීය:
*"නීතියේ ආධිපත්‍යයට සහ ප්‍රජාතන්ත්‍රවාදයට කැපවූ සියලූ දෙනාටම මෙය දැඩි සැලකිල්ලක් දක්වන මොහොතකි. ජනාධිපති සිරිසේන විසින් සාමය, යුක්තිය සහ සංහිඳියාව ඇති කිරීම සඳහා සිය ජනතාවට අතීතයේදී ලබා දුන් පොරොන්දු ඉටු කිරීම වෙනුවෙන් පෙනී සිටිය යුතුය. - ඒ සියල්ල ළඟාකරගත හැක්කේ ව්‍යවස්ථාව දැඩි ලෙස පිළිපැදීමෙන් හා ගරු කිරීමෙන් පමණි."*

---

කරුණාකර මාධ්‍ය විමසීම් සඳහා ගෞරවනීය වැඩිහිටියන්ගේ සන්නිවේදන ප්‍රධානී, විලියම් ෆ්‍රෙන්ච් අමතන්න (+44 7795 693 903) විද්‍යුත් තැපෑල: media@theElders.org

---

**පසුබිම:** ගෞරවනීය වැඩිහිටියන් යනු නෙල්සන් මැන්ඩෙලා විසින් එක්රැස් කරනු ලැබූ, සාමය ගොඩනැගීමට, මානව හිමිකම් ආරක්ෂා කිරීමට, සහ යුක්තිය හා සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමට සහාය ලබාදීම සඳහා සාමූහික බලපෑම හා අත්දැකීම් ලබාදෙන ස්වාධීන අන්තර්ජාතික නායකයින්ය. 2007දී ආරම්භ කරන ලද මෙහි අතීත සහ වර්තමාන සාමාජිකයින්ට කොෆි අනන්, අගරදගුරු ඩෙස්මන්ඩ් ටුටු, ජිමී කාටර් සහ මේරි රොබින්සන් යන අය ඇතුළත්ය.